# රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு

**Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government**

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව.
சுதந்திர சதுக்கம், கொழும்பு 07,இலங்கை.
Independence Square, Colombo 07, Sri Lanka.


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No | PL/02/02/නිල කාලය | ඔබේ අංකය<br>உமது இல<br>Your No | | දිනය<br>திகதி<br>Date | 2023.05.29 |

සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්

**<u>ධූර කාලය අවසන් වූ පළාත් පාලන ආයතනවල කටයුතු පවත්වාගෙන යාම</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් මවිසින් සමාංක සහ 2023.05.09 දිනයෙන් ඔබ වෙත එවන ලද ලිපිය අවලංගු කරනු ලබන අතර ඒ වෙනුවට පහත සඳහන් උපදෙස් ඔබ වෙත නිකුත් කරනු ලැබේ.

ධූර කාලය අවසන් වූ පළාත් පාලන ආයතන වෙත නැවත ධූරධාරීන් පත් කරන තෙක් එම පළාත් පාලන ආයතනවල කටයුතු අධීක්ෂණය කිරීම උදෙසා පළාත් පාලන මූලික නීතිවල සඳහන් ආකාරයට වැඩපිළිවෙලක් යෙදීම සුදුසු බවට 2023.03.29, 2023.04.03 යන දෙදින අරලියගහ මන්දිරයේදී ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් සහ පාර්ලිමේන්තු මැති ඇමතිවරු, පළාත් ආණ්ඩුකාරතුමන්ලාගේ සහ පළාත් ප්‍රධාන ලේකම්වරුන්ගේ සහභාගීත්වයෙන් පැවති රැස්වීම්වලදී අදහස් ප්‍රකාශ විය. මේ අනුව,

I. සෑම ආණ්ඩුකාරවරයෙකු විසින්ම තමන් යටතේ ඇති පළාත් පාලන ආයතනවල සම්බන්ධීකරණ කටයුතු සඳහා දැනට රාජකාරිවල නියුතු සංවර්ධන නිලධාරියකු හෝ වෙනත් සුදුසු නිලධාරියකු පත් කල යුතුය.

II. එලෙස නම් කරනු ලබන නිලධාරීන්ගේ ප්‍රධාන වගකීම වන්නේ ආණ්ඩුකාරවරුන් වෙනුවෙන් අදාල ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව සමඟ පළාත් පාලන ආයතනයේ කටයුතු සම්බන්ධීකරණය කිරීම හා වාර්තා කිරීමය.

III. 2023 වර්ෂය සඳහා අනුමත කරන ලද අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම, සහ මහජන සේවා සහ සංවර්ධන කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සම්බන්ධයෙන් නාගරික කොමසාරිස්/සභා ලේකම් අදාල අනපනත්වල සඳහන් ආකාරයට කටයුතු කල යුතුය.

**කේ.ඩී.එන්. රංජිත් අසෝක**
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

පිටපත්:

1. සියලුම ගරු ආණ්ඩුකාරවතුමන්ලා
2. සියලුම ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු ගරු සභාපතිවරු
3. සියලුම පළාත් පාලන කොමසාරිස්වරු


| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2696211-13<br>011-2166000 | ෆැක්ස්<br>தொலைநகல்<br>Fax | 011-2695279 | ඊ-මේල්<br>மின்னஞ்சல்<br>E-mail | information@pubad.gov.lk | වෙබ් අඩවිය<br>இணையத்தளம்<br>Website | www.pubad.gov.lk |